# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,932/2 — 1970 නොවැම්බර් 14 වැනි සෙනසුරාද — 1970.11.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)

# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

එල්. ඩී.—බී. 51/39
ප. පා. දෙ.—එච්සී. 1/1/1

### ගම් සභා ආඥාපනත

54 වැනි වගන්තිය යටතේ වූ ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥා පනතෙහි 54 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ගම් ප්‍රදේශයේ ගම් සභාව සම්බන්ධයෙන්—

(අ) අදක්ෂතාවය සහ අයථා පාලනය, සහ

(ආ) එකී ආඥාපනතින් පැවරුණු බලතල අනිසි ලෙස යෙදීම,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට සෑහීමට පත්ව, මෙම ආඥාවෙන්—

(අ) මහව ගම් සභාව විසුරුවා හරිමි ; තවද

(ආ) ඒ ගම් ප්‍රදේශය සඳහා අලුතින් ගම් සභාවක් තෝරා පත්කර ගන්නා තුරු ද ඒ ගම් සභාව විසින් එහි සභාපතිවරයා තෝරා පත්කර ගන්නා තුරු ද, ඒ ගම් ප්‍රදේශයේ කටයුතු පාලනය කරන ලෙස කුරුණෑගල සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට නියම කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

11–703

---

### බෙලිඅත්ත සුළු නගර සභාවේ සීමා දීර්ඝ කිරීම සහ කොට්ඨාශ බෙදීම

ගරු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් අයගෙන් සමන්විත නිල කමිටුවක් :—

1. හම්බන්තොට කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්—එච්. පී. විජේසිංහ මහතා (සභාපති)
2. දකුණු ගිරුවා පත්තුවේ ආදායම් පාලක නිළධාරී—ඇල්. පී. විතානාච්චි මහතා
3. තංගල්ල වැඩ බලන මැණුම් අධිකාරී—ජේ. රදම්පොල මහතා

පහත සඳහන් කරුණු ගැන පරීක්ෂා කර බලා වාර්තා කිරීමට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

(අ) දැනට ඇති බෙලිඅත්ත සුළු නගර සභා සීමාවලින් පිටස්තරව ඇති යම්කිසි ප්‍රදේශයක් එම නගර සභා සීමාව තුලට ඒකාබද්ධ කළ යුතු ද ?

(ආ) සභිකයෙකු නියෝජනය කරන එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතාක් දුරට සමාන වන සේ ප්‍රදේශයේ විශාලත්වය ජනගහණය හා වෙනත් හේතු සාධක ද සොයා බලා බෙලිඅත්ත සුළු නගර සභාව සමන්විත විය යුතු සභික සංඛ්‍යාව

(ඇ) සුළු නගර සභාවේ සීමාවල විස්තර හා

(ඈ) සුළු නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර සම්බන්ධ කරුණු පරීක්ෂා කොට වාර්තා කිරීම

මේ සම්බන්ධයෙන් නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමැති සංවිධාන හා මහජනයා 1970 නොවැම්බර් මස 30 දිනට පෙර එවැනි නියෝජන පිටපත් තුනකින් (3) යුතුව ලිඛිතව, හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබෙන්නට ලියා පදිංචි කළ තැපෑලෙන් එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

හෙ. පැ. විජේසිංහ,
නිල කමිටුවේ සභාපති හා පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට.

1970 නොවැම්බර් මස 8 දින,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
හම්බන්තොට.

11–704

---

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

1 A—ජේ 18228—5,700 (70/11)